# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.10.30 පැය 0540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1962/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු**

**01. ගංජා හේනක් වටලා වියළි ගංජා තොගයක් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - තණමල්විල පොලිස් ස්ථානය.**

2025.10.29 වන දින දහවල් කාලයේ තණමල්විල පොලිස් වසමේ නිකවැව ප්‍රදේශයේදී තණමල්විල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ඇත. **එහිදී වගා කර තිබූ ලක්ෂ 04 ක පමණ ගංජා ගස් ප්‍රමාණයක් සහ වියළි ගංජා කිලෝ 128 ක් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 38, 52 සහ 61 වයස්වල පසුවන ඇඹිලිපිටිය සහ මිද්දෙණිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

වගා කර තිබූ විවිධ ප්‍රමාණයේ උසින් යුත් ගංජා ගස් කිහිපයක් අධිකරණයට ඉදිරිපත් කිරීමට සාම්පල් ලෙස ලබා ගෙන ඉතිරිය එම ස්ථානයේ විනාශ කිරීමට කටයුතු කර ඇත. තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. පතලක පස් කන්දක් කඩා වැටී පුද්ගලයෙකු මියයාම - පින්නවල පොලිස් වසම.**

2025.10.29 වන දින උදෑසන කාලයේ පින්නවල පොලිස් වසමේ වළවඅද්දර ප්‍රදේශයේ ඉඩමක පවත්වාගෙන ගිය පතලක පස් කන්දක් කඩා වැටී ඊට යටවීමෙන් පුද්ගලයෙකු බලංගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට පින්නවල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවරුදු 27 ක් වූ පින්නවල, බලංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය බලංගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පින්නවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. නාඳුනන මෘත ශරීර දෙකක් හමුවීම - මට්ටක්කුලිය පොලිස් වසම.**

2025.10.29 වන දින උදෑසන සහ සවස් කාලවලදී මට්ටක්කුලිය පොලිස් වසමේ කාක දූපත වෙරළ තීරයේ සහ කැළණි ගඟ මෝය කට අසල නාඳුනන පිරිමි මෘත ශරීර දෙකක් ඇති බවට මට්ටක්කුලිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුවන්ගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීර කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - පමුණුගම පොලිස් වසම.**

2025.10.29 වන දින සවස් කාලයේ පමුණුගම පොලිස් වසමේ එපාමුල්ල ප්‍රදේශයේ ඉදිකරමින් පවතින දෙමහල් නිවසක පිටුපස ඇති ඉඩමේ නාඳුනන පිරිමි මෘත ශරීරයක් ඇති බවට පමුණුගම පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර කළු පැහැති සරමක් හා ලානිල් පැහැති අත්කොට කමිසයක් හැඳ සිට ඇති අතර වයස අවුරුදු 50ත් 60ත් අතර උස අඩි 05 අගල් 07 ක් පමණ වන කෙට්ටු සිරුරකි.**

මෘත ශරීරය හදිසි මරණ පරීක්ෂණයෙන් පසු රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. මාරක රිය අනතුරක් - කැකිරාව පොලිස් වසම.**

2025.10.29 වන දින උදෑසන කාලයේ කැකිරාව පොලිස් වසමේ මහනුවර යාපනය මාර්ගයේ කැකිරාව උසාවිය හන්දිය ආසන්නයේදී කැකිරාව දෙස සිට මරදන්කඩවල දෙසට ධාවනය වූ ට්‍රැක්ටර් රථයක් මාර්ගය අයිනේ ගමන් කරමින් සිටි පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික කාන්තාව කැකිරාව රෝහට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 73 ක් වූ හීනුක්කිරියාව, ගනේවැල්පොල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ට්‍රැක්ටර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කැකිරාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - මිරිහාන පොලිස් වසම.**

2025.10.29 වන දින දහවල් කාලයේ මිරිහාන පොලිස් වසමේ කොට්ටාව ඇඹුල්දෙණිය මාර්ගයේ ඇඹුල්දෙණිය දෙසට ධාවනය වූ කාර් රථයක් රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකි වී මාර්ගයේ අයිනේ නවතා තිබූ ත්‍රිරෝද රථයක හා කාර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රිරෝද රථයේ රියදුරු කළුබෝවිල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 60 ක් වූ තලවතුගොඩ, කෝට්ටේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මිරිහාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**